# කොරියානු භාෂා විශේෂ පරීක්ෂණය නිවේදනය කිරීම

## පරිගණක ආශ්‍රිත පරීක්ෂණය(CBT-Computer Based Test)

කොරියානු ජනරජයේ රැකියා හා කම්කරු අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා විදේශ රැකියා අමාත්‍යාංශය අතර අත්සන් කරනු ලැබූ අවබෝධතා ගිවිසුම (MOU)ප්‍රකාරව රැඳීසිටීමට ලබාදී ඇති අවසරලත් කාලසීමාව තුළ ස්වකැමැත්තෙන් මෙරටට පැමිණ නැවත කොරියාවේ සේවය සඳහා පිටත්වීමට කැමැත්තක් දක්වන සේවකයන් සම්බන්ධයෙන් වන විශේෂ කොරියානු භාෂා ප්‍රවීණතා පරීක්ෂණය (Special EPS – TOPIK) පහත පරිදි ශ්‍රී ලංකාවේදී පැවැත්වේ.

කොරියානු ජනරජයේ රැකියා කිරීමට බලාපොරොත්තු වන සේවකයින් කොරියාවේ මානව සම්පත් සංවර්ධන ආයතනය විසින් පවත්වන මෙම පරීක්ෂණය සමත්විය යුතුවේ. මෙම පරීක්ෂණය සමත්වන පුද්ගලයින්ට පමණක් රැකියා බලපත්‍ර ක්‍රමය(EPS) යටතේ අයදුම්පත් ඉදිරිපත් කළ හැකිවේ.

2021 ජූලි මස 14 වැනිදා

අධීක්ෂණය : රැකීරක්ෂා හා කම්කරු අමාත්‍යාංශය - කොරියාව

පරිපාලනය : කොරියානු මානව සම්පත් සංවර්ධන සේවා ආයතනය

සහයෝගීතාවය : සමාජ සංවර්ධන,රැකියා සහ කම්කරු සබඳතා සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කායර්ාංශය

01.පරීක්ෂණ කාලසටහන

| ලියාපදිංචි කාලසීමාව | පරීක්ෂණ දිනය නිවේදනය | පරීක්ෂණ කාලසීමාව | ප්‍රතිඵල නිවේදනය | වයස් සීමාව |
|---|---|---|---|---|
| අගෝස්තු මස 03 සිට<br><br>අගෝස්තු මස 05 - දක්වා | අගෝස්තු 25 | සැප්තැම්බර් 01 සිට සැප්තැම්බර් 10 | ඔක්තෝම්බර් මස 20 | 1981, අගෝස්තු මස 04 සිට<br>~<br>2003 අගෝස්තු මස 03 දක්වා |

* රැකියා බලපත්‍ර ක්‍රමයේ ස්වභාවයට අනුකූලව මෙම කාලසටහන වෙනස්විය හැක.

## 02.(අනුමත) කමර්ාන්ත වගර් - නිෂ්පාදන, ඉදිකිරීම්, හා ධීවර

අයදුම්කරුට තමා මව් රටට පැමිණීමට පෙර වසරකට වඩා වැඩි කාලයක් අවසන්වරට සේවය කළ රැකියා ස්ථානයම නිදෙර්ශ කරගැනීමට අවශ්‍ය නම් ඔහු /ඇය අයදුම්කිරීමේ දී අදාළ ක්ෂේත්‍රයම තෝරාගැනීමට සුපරික්ෂාකාරී විය යුතුය.

## 03. පරීක්ෂණය සමත් කිරීමට අපේක්ෂිත සංඛ්‍යාව - දැනුම්දීමට නියමිතය

- පරීක්ෂණය සමත් අයදුම්කරුවන් අතුරින් රැකියා ක්ෂේත්‍රය නොසලකා මුළු ලකුණු 200 න් 100 ට වඩා ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් අතුරින් ඉහළම ලකුණු මට්ටම අනුව සමත්වන්නන් පිළිබඳව පසුව දැනුම්දෙනු ලැබේ.

**04.** **පරීක්ෂණ ස්ථානය හා දිනය නිවේදනය**

- **පරීක්ෂණ ස්ථානය -පරිගණක ආශ්‍රිත පරීක්ෂණය (CBT පරීක්ෂණ ශාලාව)**
  **අංක 205,දෙපානම,පන්නිපිටිය**

- **පරීක්ෂණ දිනය නිවේදනය කිරිම-2021 අගෝස්තු මස 25**

- **පරීක්ෂණ නිවේදන ක්‍රමවේදය**

  - EPS-TOPIK **වෙබ් අඩවිය** (http://www.epstopik.hrdkorea.or.kr)
  - **කායර්ාංශ වෙබ් අඩවිය** (http://www.slbfe.lk)

**05.සුදුසුකම්**

- මූලික ගිවිසුම ප්‍රකාරව අවසරලත් කාලසීමාව තුළ ස්වේච්ඡාවෙන් (2010.01.01 දිනට පසුව) මව් රටට පැමිණෙන ශ්‍රමිකයින්

- වයස් සීමාව අවුරුදු 18 සහ 39 අතර

- අයදුම්කරුවන් සිරගතවීමක් හෝ බරපතල දඬුවමකට ලක්වී නොසිටීම.

- අයදුම්කරුවන් සඳහා කොරියානු ජනරජයෙන් පිටුවහල් කිරීමේ හෝ පිටත්වීමේ නියෝග වාතර්ාවක් නොතිබිය යුතුය. කොරියාවේ නීති විරෝධී ලෙස එක් දිනක් හෝ රැඳී නොසිටීම.

- අයදුම්කරුවන් ශ්‍රී ලංකාවෙන් පිටත්වීමේ තහනමකට ලක්නොකොට තිබීම.

- **E-9 වීසා කාණ්ඩය සහ E-10 වීසා කාණ්ඩය යන වීසා කාණ්ඩ දෙක යටතේම වු සේවා කාලයද ඇතුළුව වසර 05කට වඩා සේවා කාලයක් දකුණු කොරියාවේ සේවය කර නොමැති තැනැත්තන් විය යුතුය.**

- **කිසියම් තැනැත්තෙකු 2017 නොවැම්බර් මස ආගමන පාලක නීතිය සංශෝධනය කිරිමට ප්‍රථමව සිය රටට ආපසු ගොස් ඇත්නම් එම තැනැත්තා වසර 05ක් හෝ ඊට වැඩි කාලයක් කොරියාවේ සිටියදී එම තැනැත්තාගේ නම මෙම පරීක්ෂණය සඳහා අයදුම් කිරිමට සුදුසුකම් ලබන්නන්ගේ ලැයිස්තුවේ නම ඇතුළත්ව තිබිය හැක.එසේ වුවද,එවැනි තැනැත්තෙකු මෙම පරීක්ෂණය සඳහා අයදුම් කිරිමට සුදුසුකම් ලබනු නොලැබේ.**

**06.** **අයදුම්පත් (ප්‍රවේශපත්‍ර) ලියාපදිංචි කිරීම.**

- **කාලසීමාව** :- 2021 අගෝස්තු 03 සිට 2021 අගෝස්තු 05 දක්වා ( දින 03)

- **ලියාපදිංචි ක්‍රමවේදය :- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කායර්ාංශ වෙබ් අඩවියට පිවිස (www.slbfe.lk) මාගර් ගතව (Online) අයදුම් කළ හැකිය.**

- **මේ සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් සහ විභාග අයදුම්පත් ගාස්තුවෙන් නිදහස් වන පුද්ගලයන්ගේ සහ අමතර ලකුණු හිමිවන අයදුම්කරුවන්ගේ නාම ලැයිස්තුව 2021.07.28 වන දින කායර්ාංශ වෙබ් අඩවියේ පල කරනු ලැබේ.**

- **ඔබගේ විදේශ ගමන් බලපත්‍ර අංකය කායර්ාංශ වෙබ් අඩවියට පිවිස ඇතුල් කිරිම මඟින් ඔබ මෙම පරීක්ෂණය සඳහා විභාග අයදුම්පත්‍ර ලබාගැනීමට සුදුසුද යන වග පරීක්ෂා කළ හැකිය (www.slbfe.lk)**

- **විභාග ගාස්තු** - ඇමෙරිකානු ඩොලර් 24කි. විභාගය සඳහා ලියාපදිංචි වන දිනට අදාළ විනිමය අනුපාතිකයට අනුව දේශීය මුදලින් **(රු. 4800 /= ක්)** ගෙවිය යුතු වේ.

※ කිසියම් අයදුම්කරුවෙක් නොවැලැක්විය හැකි හේතුවක් නිසා තම විභාගයට පෙනී නොසිටින්නේ නම් ඔහුට / ඇයට විභාග ගාස්තු ලියාපදිංචි කාලය තුළ ආපසු ලබාගත හැකිය. (කෙසේවුව ද අවලංගු කිරීමකින් පසුව නැවත ලියාපදිංචිය සඳහා ඉඩකඩ දෙනු නොලැබේ)

- ලියාපදිංචිය පැමිණීමේ පිළිවෙල අනුව සිදුවන අතර, අයදුම්කරුවන් වැඩි ප්‍රමාණයක් අයදුම්කිරීම මත අමතර පරීක්ෂණ දිනයක් තීරණය කිරීම හා පරීක්ෂණය පැවැත්වීම ඒ අනුව සිදුකරනු ලබයි. පරීක්ෂණය පැවැත්වෙන බව නිවේදනය කරනු ලබන දින එක් එක් අයදුම්කරුවන්ට අදාළව පරීක්ෂණ ස්ථානය, පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතු දිනය හා වේලාව www.slbfe.lk වෙබ් අඩවියෙන් පරීක්ෂා කළ හැකිය.

අමතර ලකුණු ලබාදීමේ ක්‍රමවේදය හා විභාග අයදුම්පත් ගාස්තුවෙන් නිදහස් වීමේ ක්‍රමවේදය

<table>
<tr><th colspan="5">අමතර ලකුණු</th><th>විභාග අයදුම්පත් ගාස්තුවෙන් නිදහස් වීම (ඔව්/ නැත)</th></tr>
<tr><td rowspan="4">ප්‍රතිවාසන උපකාරක වැඩසටහන් සම්පූර්ණ කිරීම</td><td>වර්ෂය</td><td colspan="2">කොරියානු භාෂා පාඨමාලාව (03 වන මට්ටම) සම්පූර්ණ කිරීම<br>(උපරිම ලකුණු 20)</td><td>Job Skill Training for employment / Starting business</td><td rowspan="4">ඔව්</td></tr>
<tr><td rowspan="2">2016</td><td>සම්පූර්ණ කිරීම</td><td>කොරියානු භාෂා පාඨමාලාව (03 වන මට්ටම) හෝ ඉන් ඉහළ</td><td>සම්පූර්ණ කිරීම</td></tr>
<tr><td>-</td><td rowspan="2">අමතර ලකුණු -20</td><td rowspan="2">අමතර ලකුණු -05</td></tr>
<tr><td>2017 වර්ෂයේ සිට</td><td>අමතර ලකුණු -05</td></tr>
<tr><td>සෘතු අනුව රාජකාරි කිරීමෙන් පසු පිටත්වීම</td><td colspan="4">සෘතු අනුව රාජකාරි කිරීමෙන් පසු පිටත්වීම ( ලකුණු 10)</td><td>නැත</td></tr>
<tr><td>යු-ටනර් ආයතන සේවකයා</td><td colspan="4">කොරියානු භාෂා පාඨමාලාව (03 වන මට්ටම) හෝ ඉන් ඉහළ<br>( ලකුණු 20)</td><td>නැත</td></tr>
</table>

※ ඔබට අමතර ලකුණු හිමි වන්නේ නම් ඊට අදාළ අයදුම්පත්‍රය විභාග අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය. **(ඇමුණුම 01)**

**07. (සැලසුම් කර ඇති) පරීක්ෂණ සාරාංශය : 2021 සැප්තැම්බර් මස 01 සිට 2021 සැප්තැම්බර් මස 10**

○ **පරීක්ෂණ සැකැස්ම සහ නිර්ණායක**

| ප්‍රශ්න ආකෘතිය | ප්‍රශ්න සංඛ්‍යාව | මුළු ලකුණු | ලබා දී ඇති කාලය |
|---|---|---|---|
| කියවීම | 20 | 100 | මිනිතුත් 25 |
| සවන් දීම | 20 | 100 | මිනිත්තු 25 |
| මුළු ලකුණු | 40 | 200 | මිනිත්තු 50 |

**ලකුණු ලබාදීමේ සංයුතිය**

<table>
<tr><th rowspan="2">මුළු ලකුණු</th><th rowspan="2">කියවීම</th><th rowspan="2">සවන් දීම</th><th colspan="3">අමතර ලකුණු ලබාදීම</th></tr>
<tr><th>ප්‍රතිවාසන උපකාරක වැඩසටහන් සම්පූර්ණ කිරීම</th><th>සෞඛ්‍ය අනුව රාජකාරි කිරීමෙන් පසු පිටත්වීම</th><th>යු-ටනර් ආයතන සේවකයා</th></tr>
<tr><td>ලකුණු 200</td><td>ලකුණු 100</td><td>ලකුණු 100</td><td>ලකුණු 05/10/20/25</td><td>ලකුණු 10</td><td>ලකුණු 20</td></tr>
</table>

○ **පරීක්ෂණ කාලසීමාව**

<table>
<tr><th rowspan="2">පරීක්ෂණ සැසිය</th><th rowspan="2">පරීක්ෂණ පහසුකම් සැපයීමේ රැස්වීම</th><th rowspan="2">අපේක්ෂකයින් දැනුවත් කිරිම</th><th colspan="2">කාලසීමාව</th></tr>
<tr><th>කියවීම(මිනිත්තු 25)</th><th>සවන්දීම (මිනිත්තු 25)</th></tr>
<tr><td>1 වන සැසිය</td><td>09.20-09.30</td><td>09.30-10.00</td><td>10.00-10.25</td><td>10.25-10.50</td></tr>
<tr><td>2 වන සැසිය</td><td>10.50-11.00</td><td>11.00-11.30</td><td>11.30-11.55</td><td>11.55-12.20</td></tr>
<tr><td>3 වන සැසිය</td><td>13.20-13.30</td><td>13.30-14.00</td><td>14.00-14.25</td><td>14.25-14.50</td></tr>
<tr><td>4 වන සැසිය</td><td>14.50-15.00</td><td>15.00-15.30</td><td>15.30-15.55</td><td>15.55-16.20</td></tr>
</table>

**සියළුම විභාග අපේක්ෂකයින් දැනුවත් කිරිමේ  වේලාවට පෙර පරීක්ෂණ කාමරය තුළ සිටිය යුතුය.**

- **පරීක්ෂණ සැකැස්ම හා සමත් කිරීමේ සම්මතය**

  - බහුවරණ ප්‍රශ්න පත්‍රය
  - විවේක කාලයකින් තොරව සවන්දීමේ හා කියවීමේ විභාගය පැවැත්වේ
  - සියළුම ප්‍රශ්ණ කොරියානු භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සඳහා විෂය නිදෙර්ශිත පොතෙන් සකසනු ලැබේ.

※ පරීක්ෂණ දිනයේ දී රැගෙන ආ යුතු දෑ

  - විභාග ප්‍රවේශපත්‍රය සහ විදේශ ගමන් බලපත්‍රය

**(විභාග ප්‍රවේශපත්‍රය සඳහා භාවිතා කරන ලද ගමන් බලපත්‍රයම විය යුතුය. වලංගු ගමන් බලපත්‍රය නොමැතිව අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටිය නොහැක)**

## 08.විභාග ප්‍රතිඵල නිවේදනය කිරීම

- දිනය - 2021  ඔක්තෝම්බර් මස 20
- දැනුම්දීමේ ක්‍රමය -
  - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කායර්ාංශයේ වෙබ් අඩවිය (http://www.slbfe.lk)
  - කොරියානු භාෂා ප්‍රවීණතා විභාග වෙබ් අඩවිය (http://epstopik.hrdkorea.or.kr)
  - කොරියානු රැකියා පිළිබඳ වෙබ් අඩවිය http://www.eps.go.kr

※ ප්‍රතිඵල වලංගු කාල සීමාව - අවුරුදු දෙකයි (ප්‍රතිඵල නිකුත් වූ දින සිට වසර දෙකක කාලසීමාවකි)

## 09. වෙනත් තොරතුරු

- අයදුම්කරු ස්වේච්ඡාවෙන්ම රටට නොපැමිණි බව තහවුරුවීම මත ඔහු /ඇය පරීක්ෂණය සමත් වුව ද ඔහුගේ/ඇයගේ පරීක්ෂණ ප්‍රතිඵල අවලංගු ලෙස සලකන අතර, ඒ සම්බන්ධ සියළු වගකීම අයදුම්කරු සතු වේ.

- සමත්වන අයදුම්කරුවන් පෙර විගමණික පුහුණුවෙන් නිදහස්වන අතර, කෙටි කාලීන නැවත ඇතුළත් වීමේ ක්‍රමවේදයකට හා කඩිනම් රැකියා ලියාපදිංචියකට සුදුසුකම් ලබයි.

- විභාගය පැවැත්වෙන දිනයේ දී වංචා කිරීම සඳහා භාවිතා කළ හැකි ජංගම දුරකථන, ස්මාට් ඔරලෝසු,Bluetooth earphones ඇතුළු  විද්‍යුත් උපකරණ රැගෙන ඒම සපුරා තහනම් වේ.

- කිසියම් අයදුම්කරුවෙකු විසින් විභාගය පැවැත්වෙන අවස්ථාවේ දී ඒවා භාවිතා කරන ලද්දේ නම් ඔහුගේ /ඇයගේ ප්‍රතිඵල අවලංගු කරනු ලබන අතර වසර 04 ක කාලයක් සඳහා අදාළ විභාග වෙනුවෙන් තහනමක් ද පමුණුවනු ලැබේ.

- අයදුම්කරුගේ විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් නම, උපන් දිනය සහ ස්ත්‍රී පුරුෂ භාවය වැනි පෞද්ගලික තොරතුරු සහ ඔවුන් විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන එකී තොරතුරු අතර අසමානකම් පැවතීම කොරියානු රැකියා වෙබ් අඩවියෙහි ලියාපදිංචි කිරීමට සහ කොරියාවට පිවිසීම ප්‍රතික්ෂේප කිරීමට හේතුවන බැවින් එවැනි වෙනස්කම් සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම අයදුම්කරුවන් වෙත පැවරේ.

  කොරියානු භාෂා ප්‍රවීණතාව ඉහළ දැමීම සඳහා සියළුම බහුවරණ ප්‍රශ්ණ භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සඳහා විෂය නිර්දේශිත පොතෙන් උපුටා ගැනීමට අපේක්ෂිතය.

කොරියානු භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සඳහා අදාළ වන විෂය නිර්දේශිත පොත පහතින් සඳහන් කරන අතර අයදුම්කරුවන් හට එය නොමිලේ බාගත කරගත හැක

(විෂය නිර්දේශය බාගත කළහැකි වෙබ් අඩවිය)

| අංශය | අන්තගර්තය | වෙබ් අඩවිය |
|---|---|---|
| HRD Korea අඩවියේ මුල් පිටුව | Textbook file(- PDF, Sound Source) | http://www.hrdkorea.or.kr/3/3/3/1/2 |
| EPS-TOPIK අඩවියේ මුල් පිටුව | Textbook file(- PDF, Sound Source) | http://epstopik.hrdkorea.or.kr |

## 10. කෝවිඩ්-19 පැතිරයාම වැළැක්වීම පිළිබඳ නිවේදනය

- විභාගය සඳහා පැමිණෙන සියළුම අයදුම්කරුවන් විභාග මධ්‍යස්ථානයට පැමිණීමේදී මුඛ ආවරණ පැළඳීම අනිවායර්යවෙන අතර කෝවිඩ්-19 වසංගත තත්ත්වයෙන් ආරක්ෂා වීම සඳහා අනුගමනය කළ යුතු සෞඛ්‍ය පුදුරු අනුගමනය කිරිම සිදු කළ යුතුය.
- විභාග මධ්‍යස්ථානයට ඇතුළුවීමට පෙර සියළුම අයදුම්කරුවන්ගේ ශරීර උෂ්ණත්වය පරීක්ෂා කරනු ලබන අතර, සියළු දෙනාම සනීපාරක්ෂක ද්‍රව්‍ය යොදා තම දෑත් පිරිසිදු කරගත යුතුය. යම් අයදුම්කරුවෙකුට උණ,කැස්ස හෝ වෙනත් ශ්වසන රෝගයකින් පෙළෙන්නේ නම් විභාග මධ්‍යස්ථානයට ඇතුළුවීමට ඉඩ ලබාදෙනු නොලැබේ.

- වැළඳගැනීම්,අතට අතදීම වැනි ශාරිරක සබඳතා වලින් වැළකී, කැස්ස වැනි රෝගයන්ගේ හැකිතාක් ආරක්ෂා වී සිටිමට ඔබ වගබලා ගත යුතුය. (කැස්ස සහ කිවිසුම් යාම)

**කොරියානු භාෂා විභාගය සමත්වීම කොරියාවේ රැකියාවක් ලබාදීම සහතික නොකරන අතර, එය ඔබගේ රැකියා අයදුම්පත්‍රය ලියාපදිංචි කිරීමට සුදුසුකමක් පමණක් සලසනු ලැබේ.**

- වෛද්‍ය පරීක්ෂණය අසමත් වන හෝ කොරියාවේ නීති විරෝධි ලෙස සේවය කර ඇති අයදුම්කරුවන් කොරියාවේ රැකියා සඳහා අයදුම්කිරීමට සුදුසුකම් නොලැබෙන අයදුම්කරුවන් සේ සලකනු ලැබේ. එසේම E-9 වීසා සඳහා වන නිණර්ායක සපුරා නොගන්නා අයකොරියානු රටෙහි සේවය කළ නොහැක.
- එසේම කොරියාවට ඇතුළුවීමෙන් පසුව පවත්වනු ලබන මත්ද්‍රව්‍ය පිළිබඳ පරීක්ෂණයෙන් කිසියම් තැනැත්තෙකු අසමත් වුවහොත් එම තැනැත්තා ආපසු තම රටට හරහා යවනු ලැබේ
- දකුණු කොරියානු ජනරජයේ රැකියා හා කම්කරු අමාත්‍යාංශය හා සමාජ සංවධර්න,රැකියා සහ කම්කරු සබඳතා අමාත්‍යාංශය

අතර, අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කායර්ාංශයට පමණක් දකුණු කොරියාවට ශ්‍රී ලාංකිකයින් යැවීම සඳහා නීත්‍යානුකූල බලයක් ඇත.

- කොරියානු භාෂා විභාගය සමත් වී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කායර්ාංශය මඟින් කොරියානු රැකියා වෙබ් අඩවියෙහි ලියාපදිංචි කරන ලද අයදුම්කරුවන් පමණක් කොරියානු රජයේ සේවා යෝජකයින් විසින් බඳවාගනු ලැබේ.
- වෙනත් කිසිම පෞද්ගලික අංශයක් කොරියාවේ රැකියා සඳහා යැවීමේ ක්‍රමයට මැදිහත් වන්නේ නම්, ඔවුන් සඳහා එවැනි ක්‍රියාවලට නීත්‍යානුකූලව දඬුවම් පවරනු ලැබේ.
- අදාළ අයදුම්පත්‍ර ලියාපදිංචි කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් 24 (**රු. 4800 /-** ) පමණක් අයදුම්කරු විසින් ශ්‍රීලංකා විදේශ සෙවා නියුක්ති කායර්ාංශය වෙත ගෙවිය යුතු අතර, මේ සම්බන්ධයෙන් වෙනත් කිසිදු පාශර්වයකට කිසිදු මුදලක් ගෙවීම සිදුනොකළ යුතු බව වැඩිදුරටත් දැනුම් දෙනු ලැබේ. එමෙන්ම රැකියා බලපත්‍ර ක්‍රමය යටතේ කොරියානු රැකියා ලබාදීම හෝ ඒ හා සම්බන්ධ කිසිදු කරුණක් උදෙසා කිසිදු වංචනික පාශර්වයකට හසු නොවන ලෙස දැනුම් දෙනු ලැබේ.

- **වණර් අන්ධතාවය,වණර් දුවර්ලතාවය ඇති අයදුම්කරුවන් හට පරීක්ෂණය සමත්වීමට අවසර නොලැබේ.**

**ඔබ විභාගය සඳහා ලියාපදිංචි වන අවස්ථාවේදී ඔබට වණර් අන්ධතාවය,වණර් දුවර්ලතාවයක් නොමැති බවට වෛද්‍යවරයෙකුගෙන් වෛද්‍ය සහතිකයක් ලබාගත යුතු අතර එම වෛද්‍ය සහතිකය මාගර්ගතව(Online) ලියාපදිංචි වනවිට එම අයදුම්පත්‍රය සමඟ ඇමිණිය යුතුය.**

**තවද, ඔබ විභාගය සමත්වීමෙන් පසුව කොරියානු රැකියා වෙබ් අඩවියට ලියාපදිංචි වීමට පෙර සිදු කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයේදී නැවතත් වණර් අන්ධතාවය පරීක්ෂාවට ලක් කරනු ලබන අතර එම අවස්ථාවේදී ඔබට වණර් අන්ධතාවය ඇති බවට තහවුරු වුවහොත් ඔබගේ විභාග ප්‍රතිඵල අවලංගු වනු ලැබේ.**

- කොඳුඇට පෙළේ ආබාධ සහ ඇඟිලි විස්තාරණය වැනි භෞතික ආබාධ සහිත අයදුම්කරුවන් වලංගු රැකියා රෝස්ටරයෙන්(ලැයිස්තුවෙන්) බැහැර කළ හැකිය.
- විභාග වංචා සඳහා සහ නීති විරෝධී ලෙස විභාගයට පෙනී සිටීම සඳහා ලබා දෙන දඬුවම් තර කර ඇති අතර යම් අයෙක් අයථා මාගර්යන්ගයන් කොරියාවට පිවිසෙන්නේ නම් ඔහුට / ඇයට විරුද්ධව නීතිය දැඩිව ක්‍රියාත්මක වේ.

## අයදුම්කරුවන් සඳහා විභාග ගාස්තු නිදහස් කිරීම සහ අතිරේක ලකුණු ලබාදීමේ අයදුම්පත්‍රය

☐ **අයදුම්කරුගේ ප්‍රකාශය**

EPS-TOPIK පරීක්ෂණය සඳහා ලියාපදිංචි වීමට මා විසින් ඉදිරිපත් කරනු ලබන ශ්‍රමිකයින් ආපසු සියරටට පැමිණීමට අදාළව ලබාදෙනු ලබන සහාය පුහුණු සහ අධ්‍යාපන පිළිබඳ ලේඛණ වංචනික වුවහොත් ඒ සම්බන්ධයෙන් වන සියළුම නිත්‍යානුකූල වගකීම මා විසින් භාරගන්නා බව මෙයින් දිවුරා ප්‍රකාශ කරමි.

※ <u>අයදුම්කරුගේ ඉහත ලේඛණ සාවද්‍ය බවට සනාථ වුවහොත් විභාග ප්‍රතිඵල අවලංගු කරනු ලබන අතර වසර 04 ක කාලයක් ගතවනතුරු අදාළ පුද්ගලයාට මෙම EPS-**TOPIK** පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වේ.</u>

අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුය

| | | | |
|---|---|---|---|
| නම | | ලියාපදිංචි අංකය | |
| උපන්දිනය | | විදේශ ගමන් බලපත්‍ර අංකය | |
| ස්ත්‍රී/පුරුෂ භාවය | | දුරකථන අංකය | |

**ප්‍රතිචාසන උපකාරක වැඩසටහන් සම්පූර්ණ කිරීම** ( උපරිම ලකුණු 25, විභාග අයදුම්පත් ගාස්තුවෙන් නිදහස්)

| | |
|---|---|
| **කොරියානු අධ්‍යාපන ක්‍රියාවලිය(උපරිම ලකුණු 20)** | **කොරියානු අධ්‍යාපන ක්‍රියාවලිය සම්පූර්ණ කළ අය සඳහා පුහුණුව ( ○ )**<br>**< 2016 වර්ෂයේ සම්පූර්ණ කළ අය සඳහා අදාළ නොවේ >** |
| | කොරියානු භාෂා පරීක්ෂණයේ 3වන මට්ටම සම්පූර්ණ කළ හෝ ඉන් ඉහළට සම්පූර්ණ කිරීමෙන් පසුව කොරියානු අධ්‍යාපන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම ( ○ ) |
| රැකියා සහ ව්‍යාපාර ආරම්භය සඳහා වෘත්තිය පුහුණුව(උපරිම ලකුණු 05) | රැකියා සඳහා වන වෘත්තිය පුහුණු වැඩසටහන සම්පූර්ණ කිරීම ( ○ ) |

සෘතු අනුව රාජකාරි කිරීමෙන් පසු පිටත්වීම ( ○ )

**යු-ටනර් ආයතන සේවකයා, කොරියානු භාෂා පාඨමාලාව (03 වන මට්ටම) හෝ ඉන් ඉහළ සම්පූර්ණ කිරීම** ( ○ )

20................./........./.............(අවුරුදද/මාසය/දිනය)

නම:.................................................(අත්සන)

**සභාපති කොරියානු මානව සම්පත් ආයතනය**